30 වන පිටෙන්

වී දුකසේ මියයයි. එම නිසා නිතරම ණයක් ගත් විට ගෙවිය යුතුයි.

(2) විවිධ දේ ප්‍රකාශ කරමින් අනුන් රැවටීම, ස්ත්‍රීන් පුරුෂයන්ද, පුරුෂයන්, ස්ත්‍රීන්ද ආදරය නිසා රැවටීමෙන් ගර්භාෂ ගත රෝග, මතක අමතක වීම, හා හදිසි දරුණු අනතුරු සිදු වේ. එම නිසා කිසි කෙනෙකුවත් දැනුවත්ව රැවටීම නොකළ යුතුයි.

(3) රැකියා ලබා ගැනීමේ දී, නිවසක් ගැනී මේ දී හා යම් කිසි උසස් ශුභ කටයුත්තකදී තමා විසින් එම තැනැත්තාට උදව් කිරීම හා උපදෙස් වීම ඉතා ශුභයි.

(4) තමාට හැකි අන්දමින් තම දෙමව්පියන්ට, ඥාතීන්ට නවාතැන් පහසුකම් ලබා දීම හා යාන වාහන පහසුකම් ලබා දීම ඉතා අවශ්‍යයි.

(5) සුදු, රේස්, හා අනවශ්‍ය මුදල් නාස්ති වන කරුණු වලින් වැලකීම ශුභයි. එම මුදල් දුගී, යාචක අයට පරිත්‍යාග කිරීම.

### වන ස්ථානයේ කුජ පිහිටීමෙන් වන අකුසල් කම් වලින් මිදීමට කළ යුතු ප්‍රතිකම්

(1) රෝගීන්ට උපස්ථානය, රෝහල් ගාස්තු ගෙවීම, බෙහෙත් හා උපකරණ පරිත්‍යාගය

(2) ලේ දන් දීම, වකුගඩු හා ශරීරයේ කොට ස් පරිත්‍යාග කිරීම.

(3) ඇස් දන් දීම, ඇස් කණ්නාඩි පරිත්‍යාගය හා අන්ධ පුද්ගලයන්ට උදව් උපකාර කිරීම.

(4) අසරණ ගැබිනි මවුවරුන්ට ආහාර පාන ප්‍රතිකාර ලබා දීම.

(5) තමාට වෛර කරන අයට ආදරයෙන් සැලකීම හා වෛර නොකිරීම.

(6) කිසිම තම රටේ නීති විරෝධී මත්ද්‍රව්‍ය, මත්පැන් දුම්වැටි ආදිය අලෙවිය හෝ පාවිච්චියෙන් වැලකීම.

### උපතින්ම ජන්ම පත්‍රයේ 8 කුජ ග්‍රහයා පිහිටීම නිසා ඇති වන ප්‍රතිවිපාක වලින් මිදීමට කළ යුතු ප්‍රතිකම්

(1) අධික වේගයෙන් වාහන පැදවීම, උස් ස්ථානවල නැගීම, අධික බර ඉසිලීම, අනතුරු දායක කාර්ය වල හි ක්‍රියා වල යෙදීම, වැනි ක්‍රියා වලින් වැලකීම අවශ්‍යයයි.

(2) රෝහල්, අනාථ නිවාස, මහලු නිවාස, සමාජ සේවා ආයතනවල රැකියාව කිරීම හෝ උදව් උපකාර වීම.

(3) සිරගත වී සිටින අයට මුදල් ගෙවා නිදහස ලබා දීම හා නීති කටයුතුවලට උදව් උපකාර කිරීම.

(4) දරුණු රෝග වලින් පෙළෙන රෝගීන්ට උපදෙස් හා ප්‍රතිකාර ලබා දීම.

(5) තම පවුලට හෝ ප්‍රදේශයට අහිතකර නීති විරෝධී ක්‍රියා නොකිරීම.

(6) රෝහල් , අනාථ නිවාස, මහලු නිවාස සාදා පූජා කිරීම.

### 1 , 2 වන ස්ථානයේ කුජ ග්‍රහයා ජන්ම පත්‍රයේ පිහිටි විට ඇතිවන ප්‍රතිවිපාක වලින් මිදීමට කළ යුතු ප්‍රතිකම්

(1) රාත්‍රී ගමන් බිමන් හා රාත්‍රී අවධියෙන් සිටීමෙන් වැලකීම.

(2) අනෙකෙකු කරන කියන කටයුතුවලට කරදර බාධා නොකිරීම.

(3) තම පවුල් ජීවිතයේ දී ඉතා සාමකාමී කටයුතු කිරීම.

(4) දරුවන් හා නෑයන් සමඟ නිතරම කථාකිරීම හා සතුටින් ජීවත් වීම.

(5) ක්‍රීඩා කිරීම, ව්‍යායාම කිරීම, හා විනෝද චාරිකා යෑම.

(6) භාවනා කිරීම, යෝගා කිරීම, හා බණ ඇසීම, දානය දීම.

ඉහත කී කරුණු වී වී ස්ථාන වල කුජ ග්‍රහයා පිහිටීම නිසා ඇති වූ කම්එල හේතු වට කළ යුතු ප්‍රතිකර්ම වලට අමතරව එම ස්ථානයේ ග්‍රහයාගේ උච්ච, සම, සතුරු, මිත්‍ර බව අනුව ලැබෙන ප්‍රතිඵල උස් පහත් වේ. එම නිසා වසරකට වරක් උගත් ජ්‍යෝතිෂ යකු ලවා තමාගේ ජන්ම පත්‍රය පරීක්ෂා කර බලා උපදෙස් ගෙන අපල සඵල කරගත යුතුයි.

තවද,
රතුමල්, රතුරෙදි, රතුපාටින් පිසින ලද ආහාර , රතු වාහන, රතු භාණ්ඩ, රතු පාවහන්, වැනි දේ පූජා කිරීමෙන් විවාහයද ඉක්මන් වේ.

අඟහරුවාදා දින වල නිර්මාංශජීව (මස් මාලු අනුභව නොකර) සිටීම ඉතා හොදයි. උදේ සවස නවග්‍රහ මන්ත්‍ර, කුජ මන්ත්‍ර, හා මහ පිරිත ඇසීම ශුභයි.
තම ඥාතීන්ගේ හෝ මිතුරු මිතුරියන්ගේ මංගල උත්සවවලට සහභාගී වීම, උන න්දුවෙන් උදව් උපකාර කිරීම ඉතා අවශ්‍යයි. විවාහයට ඉතා හොඳ කෙනෙකු එම ස්ථාන වලදී හමු වේ.

නිතරම ඉවසීමෙන් කථා කිරීම, ආදරයෙන් කථා කිරීම, අනුකම්පා කිරීම හා පිහිටවීම ඉතා අවශ්‍යය.

ආයුර්වේද වෛද්‍ය ජ්‍යොතිෂ විශාරද
**වෛද්‍ය ස්ටැන්ලි ධම්කුමාර**
සිද්ධාර්ථ ජ්‍යොතිෂ අසපුව







විමසීම්
03 9747 1902 | 0490 046 996
181, Paynes rd, Rockbank, VIC. 3335

